# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 1117/ 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 07/07/2024 පැය 1305

## මාධ්‍ය නිවේදනය

### "නීතිගරුක රටක්" යන තේමාව යටතේ ඌව පළාත් ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් බල ගැන්වීම.

නීතිගරුක සමාජයක් නිර්මාණය කිරීම සඳහා ගරු මහජන ආරක්ෂක අමාත්‍ය ටිරාන් අලස් මහතාගේ උපදේශකත්වයෙන් පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතාගේ සෘජු අධීක්ෂණය යටතේ දිවයින පුරා පොලිස් ස්ථාන 602 ක් ආවරණය වන පරිදි අපරාධ හා මත්ද්‍රව්‍ය නිවාරණය කිරීම අරමුණු කර ගනිමින් යුක්තිය මෙහෙයුම ආරම්භ කරන ලදි. එම මෙහෙයුම සඳහා උක්ත පොලිස් වසම් 602 හි පිහිටුවා ඇති ප්‍රජා පොලිස් කමිටු සමාජිකයින්ගෙන් සුවිශේෂී දායකත්වයක් දක්වනු ලබයි.

එලෙස දායකත්වය ලබා දෙනු ලබන ඌව පළාතේ ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් බල ගැන්වීම සඳහා විශේෂ වැඩමුළුවක් 2024.07.06 වන අද දින පස්වරු 0300 ට වැල්ලවාය පොලිස් වසමේ මහජන ක්‍රීඩා පිටියේදී පැවැත්විය. මෙම අවස්ථාවට මොණරාගල කොට්ඨායට අයත් පොලිස් ස්ථාන 19 හි ප්‍රජා පොලිස් කමිටු 296 ට අයත් කමිටු සාමාජිකයින් 3500 ක්, බණ්ඩාරවෙල පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථාන 14 හි ප්‍රජා පොලිස් කමිටු 284 ට අයත් කමිටු සාමාජිකයින් 3250ක් හා බදුල්ල පොලිස් කොට්ඨාසයට අයත් පොලිස් ස්ථාන 15හි ප්‍රජා පොලිස් කමිටු 283ක කමිටු සාමාජිකයින් 3250 ක් ඇතුළු සාමාජිකයින් 10,000කට ආසන්න පිරිසක් මෙම වැඩමුළුවට සහභාගී විය.

මෙම වැඩසටහන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගරු ජනාධිපති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන්, මහජන ආරක්ෂක අමාත්‍ය ගරු ටිරාන් අලස් මැතිතුමා, ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක හා ජනාධිපති කාර්ය මණ්ඩල ප්‍රධානී සාගල රත්නායක මහතා, මහජන ආරක්ෂක අමාත්‍යාංශ ලේකම් වියානි ගුණතිලක මහතා සහ පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මහතා සහභාගි විය.

මෙම ප්‍රජා පොලිස් කමිටු බලගැන්වීම යටතේ දිවයින පුරා පිහිටුවා ඇති ප්‍රජා පොලිස් කමිටු සමාජිකයින්ගේ සේවාව අගය කරමින් සාමාජිකයින්ට හැඳුනුම්පතක් හා තෝරා ගන්නා ලද

තවත් සමාජිකයින්ට සාමදාන විනිශ්චයකාර පත් වීම් ලබා දීමක් සිදුකල අතර ඒ සමාජිකයින් 30 දෙනෙකු සඳහා සාමදාන විනිශ්චයකාර පත් වීම් 30 ක් සංකේතාත්මකව ලබා දීම හා ඌව පළාත නියෝජනය සංකේතවත් කරමින් ප්‍රජා පොලිස් කමිටු සාමාජිකයින් 30 දෙනෙකු සඳහා හැඳුනුම්පත් ලබා දීමක් සිදු කරන ලදී.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**